# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## මෝටර් වාහන (සංශෝධන)

**(203 වන අධිකාරය වූ) මෝටර් වාහන පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.**

---

ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා විසින් 2017 සැප්තැම්බර් මස 06 වන දින ඉදිරිපත් කරන ලදී.

(ගැසට් පත්‍රයේ පළ කළේ 2017 අගෝස්තු මස 21 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී.

---

**[203 වන පනත් කෙටුම්පත]**

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

**මිළ : රු. 18.00 යි.** **තැපැල් ගාස්තුව : රු. 15.00 යි.**

2—PL 005428—510 (2017/09)

## නීතිය බලපෑමේ ප්‍රකාශය

***2 වන වගන්තිය:*** මේ වගන්තිය මගින් (මෙහි මින් මතු “ප්‍රධාන ප්‍රඥප්තිය” යනුවෙන් සඳහන් කරනු ලබන) (203 වන අධිකාරය වූ) මෝටර් වාහන පනත සංශෝධනය කරනු ලබන අතර සංශෝධනයේ නීතිය බලපෑම වනුයේ, ''රියදුරු අභිවෘද්ධි ලකුණු'', ''ආබාධිතයන් සඳහා වූ රථ'' සහ ''සාමාන්‍ය බලපත්‍රය'' යන වචන යෙදී ඇති කවර හෝ ස්ථානයක දී ඒ වෙනුවට පිළිවෙළින් ''අවාසි සහගත ලකුණු'', ''ආබාධ සහිත තැනැත්තන් විසින් භාවිතා කරනු ලබන වාහනය'' සහ ''රියදුරු බලපත්‍රය'' යන වචන ආදේශ කිරීම වේ.

***3 වන වගන්තිය:*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 5(2) වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ, මෝටර් නිවස සහ කොඩ්‍රිසයිකලය යන වාහන ලියාපදිංචි කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම වේ.

***4 වන වගන්තිය:*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 19 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ, අන්තරායදායක භාණ්ඩ ප්‍රවාහනය කිරීමේ විෂය පථය තවදුරටත් නියාමනය කිරීම වන අතර, එය 12 වන වගන්තියට කරන ලද සංශෝධනයට ආනුෂංගික වේ.

***5 වන වගන්තිය:*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 122 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ, දේශීය අවශ්‍යතා සරිලන ආකාරයට අයිඑස්ඕ ප්‍රමිති ලබා දීම සහ රියදුරු බලපත්‍ර වර්ගීකරණයට මෝටර් නිවස සහ කොඩ්‍රිසයිකලය ඇතුළත් කිරීම වේ.

***6 වන වගන්තිය:*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 122අ වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වගන්තියේ නීතිය බලපෑම වනුයේ, මෝටර් වාහන සඳහා නිකුත් කරන ලද රියදුරු බලපත්‍රය හෝ අවසර පත්‍ර පැහැදිලිව වර්ගීකරණය කිරීම වේ.

***7 වන වගන්තිය:*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 124 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ, ශාරීරික යෝග්‍යතාවයට අමතරව මානසික තත්ත්වය පරීක්ෂා කර බැලීමට ඉඩ ලබා දීම සඳහා වෛද්‍ය පරීක්ෂණයේ විෂය පථය පුළුල් කිරීම සහ රියදුරු බලපත්‍ර නිකුත් කිරීම වඩාත් යහපත් ආකාරයට නියාමනය කිරීම වේ.

***8 වන වගන්තිය:*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 125 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ, 5 වන වගන්තියෙහි රියදුරු බලපත්‍ර වර්ගීකරණය කිරීම සඳහා කරන ලද සංශෝධනයට ආනුෂංගික වේ.

***9 වන වගන්තිය:*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 126 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ, 5 වන වගන්තියෙහි රියදුරු බලපත්‍ර වර්ගීකරණය කිරීම සඳහා කරන ලද සංශෝධනයට ආනුෂංගික වේ.

***10 වන වගන්තිය:*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 126ආ වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ, 5 වන වගන්තියෙහි රියදුරු බලපත්‍ර වර්ගීකරණය කිරීම සඳහා කරන ලද සංශෝධනයට ආනුෂංගික වේ.

***11 වන වගන්තිය:*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 128අ වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ, බලපත්‍රයක් දරන්නකුට හදිසි සේවා වාහනයක් හෝ පොදු සේවා වාහනයක් පැදවීම සඳහා බලය පැවරීම වේ.

***12 වන වගන්තිය:*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියට අලුතින් 128ඇ වන වගන්තිය ඇතුළත් කරනු ලබයි. නව වගන්තිය මගින් රසායනික ද්‍රව්‍ය, උපද්‍රවකාරී අපද්‍රව්‍ය, ඛනිජතෙල් නිෂ්පාදන, ගෑස් හෝ වෙනත් අන්තරායදායක භාණ්ඩ පැටවූ මෝටර් වාහන පැදවීම සඳහා බලපත්‍රයක් ලබා ගැනීම සඳහා වූ කාර්ය පටිපාටිය විධිමත් කිරීම වේ.

***13 වන වගන්තිය:*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 133අ වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ, දත්ත පද්ධතිය මගින් අවාසි සහගත ලකුණු ඇතුළත් කිරීමේ ක්‍රියාවලිය කාර්යක්ෂමව කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම වේ.

***14 වන වගන්තිය:*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියට අලුතින් 133ආ වන වගන්තිය ඇතුළත් කරනු ලබයි. නව වගන්තිය මගින් මේ පනත යටතේ නිශ්චිතව දක්වා ඇති වැරදි සඳහා වූ දණ්ඩන පැනවීමේ දී අවාසි සහගත ලකුණු ඇතුළත් කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම වේ.

***15 වන වගන්තිය:*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 139ආආ වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ, 5 වන වගන්තියෙහි රියදුරු බලපත්‍ර වර්ගීකරණය කිරීම සඳහා කරන ලද සංශෝධනයට ආනුෂංගික වේ.

***16 වන වගන්තිය:*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 140 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ, වේග සීමාවන් සඳහා වෙනස්කම් නියාමනය කිරීම වඩාත් පහසු කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම වේ.

***17 වන වගන්තිය:*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 157අ වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ, ආසන පටි භාවිත කිරීමට අදාළ විධිවිධාන උල්ලංඝනය කරන යම් තැනැත්තකුට ස්ථානීය දඩයක් පැනවීමට හැකි වීම වේ.

***18 වන වගන්තිය:*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 161 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ, නියම කරනු ලැබිය හැකි වූ ආකෘති පත්‍රයක් මගින් යම් අනතුරක් වාර්තා කිරීම සඳහා විධවිධාන සැලැස්වීම වේ.

***19 වන වගන්තිය:*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 215අ වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ, ඉලෙක්ට්‍රොනික මාධ්‍යයන් ඇතුළත් කිරීමෙන් ස්ථානීය දඩ ගෙවීම පහසු කිරීම සහ කාර්යක්ෂම කිරීම සහ නියෝග මගින් ස්ථානීය දඩ පැනවීම සඳහා විධිවිධාන සැලැස්වීම වේ.

***20 වන වගන්තිය:*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 224 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ, අනෙකුත් වරදවල් සඳහා පොදු දණ්ඩනය වැඩි කිරීම වේ.

***21 වන වගන්තිය:*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 240 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ, ''මියයාම'', ''අවාසි සහගත ලකුණු'', ''ඉලෙක්ට්‍රොනික'', ''හදිසි අවස්ථා වාහන'', ''මෝටර් නිවාස'', ''කොඩ්‍රිසයිකල්'', ''විශේෂ කාර්ය වාහන'', ''වාහනය'' සහ ''ආබාධ සහිත තැනැත්තන් විසින් භාවිත කරන වාහන'' යන යෙදුම් සඳහා අර්ථ නිරූපණ ඇතුළත් කිරීම වේ.

***22 වන වගන්තිය:*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ දෙවන උපලේඛනය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වගන්තියේ නීතිය බලපෑම වනුයේ, 23, 24, 24අ, 99, 128අ, 130, 135, 139අ, 141, 144අ, 152අ, 155අ, 157අ, 160, 164, 179, 188, 199 සහ 196 යන වගන්ති සඳහා අමාත්‍යවරයාට ස්ථානීය දඩ නියම කිරීමට හැකි වීම වේ.

## මෝටර් වාහන
## (සංශෝධන)

එල්.ඩී.—ඕ. 4/2012

**(203 වන අධිකාරය වූ) මෝටර් වාහන පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

ලුහුඬු නාමය.

**1.** මේ පනත 2017 අංක   දරන මෝටර් වාහන (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

(203 වන අධිකාරය වූ) මෝටර් වාහන පනත සංශෝධනය කිරීම.

**2.** (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) (203 වන අධිකාරය වූ) මෝටර් වාහන පනත පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) ප්‍රධාන ප්‍රඥප්තියේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක, දැන්වීමක, නිවේදනයක, ගිවිසුමක, සන්නිවේදනයක හෝ වෙනත් ලේඛනයක "රියදුරු අභිවෘද්ධි ලකුණු" යන වචන යෙදී ඇති ඕනෑම ස්ථානයක් සඳහා ම"අවාසි සහගත ලකුණු" යන වචන ආදේශ කිරීමෙන්;

(2) ප්‍රධාන ප්‍රඥප්තියේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක, දැන්වීමක, නිවේදනයක, ගිවිසුමක, සන්නිවේදනයක හෝ වෙනත් ලේඛනයක "ආබාධිතයන් සඳහා වූ රථය" යන වචන යෙදී ඇති ඕනෑම ස්ථානයක් සඳහා ම "ආබාධ සහිත තැනැත්තන් විසින් භාවිත කරනු ලබන වාහනය" යන වචන ආදේශ කිරීමෙන්;

(3) ප්‍රධාන ප්‍රඥප්තියේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක, දැන්වීමක, නිවේදනයක, ගිවිසුමක, සන්නිවේදනයක හෝ වෙනත් ලේඛනයක "සාමාන්‍ය බලපත්‍රය" යන වචන යෙදී ඇති ඕනෑම ස්ථානයක් සඳහා ම "රියදුරු බලපත්‍රය" යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය සංශෝධනය කිරීම.

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 5(2) වන වගන්තියේ (අ) ඡේදයේ "මොටර් රථයක්, ද්විත්ව කාර්ය වාහනයක්"යන වචන වෙනුවට "මෝටර් රථයක්, මෝටර් නිවසක්, කොඩ්‍රිසයිකලයක්, ද්විත්ව කාර්ය වාහනයක්" යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 19 වන වගන්තිය සංශෝධනය කිරීම.

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ 19 වන වගන්තියේ (ඝ) ඡේදය ඉවත් කර පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

2—PL 005380 -475 (2017/08)

"(ඎ) රසායන ද්‍රව්‍ය, උපද්‍රවකාරී අපද්‍රව්‍ය, ඛණිජ තෙල් නිෂ්පාදන, ගෑස් හෝ වෙනත් අන්තරායදායක භාණ්ඩ ප්‍රවාහනය කිරීම නියාමනය කිරීම;".

ප්‍රධාන ප්‍රඥප්තියේ 122 වන වගන්තිය සංශෝධනය කිරීම.

**5.** ප්‍රධාන ප්‍රඥප්තියේ 122 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) එම වගන්තියේ (1) වන වගන්තියේ "අයිඑස් ඕ/ ටීඅර්සී / එෆ්ඩීඅයිඑස්- 18013-1-2005 (ඉ) හි අර්ථ නිරූපණය කර ඇති පරිදි 1, 2, 3 සහ 5 තීරුවල නිශ්චිතව දැක්වෙන පන්තියක මෝටර් වාහනයක්" යන වචන වෙනුවට "දේශීය අවශ්‍යතා ඉටු කරමින් අයිඑස්ඕ හි අර්ථ නිරූපණය කර ඇති පරිදි 1, 2, 3, 4, සහ 5 වන තීරුවල නිශ්චිතව දැක්වෙන පන්තියක මෝටර් වාහනයක්" යන වචන යෙදීමෙන්;

(2) එම වගන්තිය සඳහා වන උපලේඛනය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපලේඛනය ආදේශ කිරීමෙන් :—

"උපලේඛනය

**මෝටර් වාහන සඳහා රියදුරු බලපත්‍ර වර්ග කිරීම**

| | 1 වන තීරුව | 2 වන තීරුව | 3 වන තීරුව | 4 වන තීරුව | 5 වන තීරුව |
|---|---|---|---|---|---|
| | විස්තරය | අලුත් පන්ති | වර්තමාන පන්ති | වෙනත් පන්ති සඳහා වලංගුතාවය | කලින් පැවති පන්ති |
| 1. | (i) එන්ජින් ධාරිතාව සී සී 99 ඉක්මවන මෝටර් සයිකල් | | ඒ | ඒ 1, ජී 1 | ඩී |
| | (ii) එන්ජින් ධාරිතාව සී සී 100 ට අඩු මෝටර් සයිකල් | | ඒ1 | ජී 1 | ඩී |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 2. | (i) | ආසන සංඛ්‍යාව රියදුරු අසුනද ඇතුළුව ආසන නවයකට වැඩි නොවන්නා වූ අවසර දෙන ලද උපරිම තාර බර කිලෝග්‍රෑම් 4500 ට අඩු මෝටර් වාහන; මෙම පන්තියේ මෝටර් වාහනවලට අවසර දෙන ලද උපරිම තාර බර කිලෝග්‍රෑම් 750 ට අඩු ට්‍රේලරයක් ද අමුණා තිබිය හැකි අතර ආබාධ සහිත තැනැත්තන් විසින් භාවිත කරනු ලබන වාහනයක් ද ඇතුළත් විය යුතු ය. | | බී | ජී 1, බී 2 | සී, සී 1 |
| | (ii) | ද්විත්ව කාර්ය වාහනයක්- මෙම පන්තියේ මෝටර් වාහනවලට අවසර දෙන ලද තාර බර කිලෝග්‍රෑම් 750 ට අඩු ට්‍රේලරයක් ද අමුණා තිබිය හැකි අතර ආබාධ සහිත තැනැත්තන් විසින් භාවිත කරනු ලබන වාහනයක් ද ඇතුළත් විය යුතු ය. | | බී | ජී 1, බී 2 | සී, සී 1 |
| | (iii) | මෝටර් නිවස | බී | බී | ජී1, බී2 | |
| 3. | (i) | මෝටර් ට්‍රයිසිකලයක් හෝ මෝටර් ට්‍රයිසිකල් වැන් රථයක් - අවසර දෙන ලද තාර බර කිලෝග්‍රෑම් 500 ට අඩු වන්නා වූ ද, වාහනයේ දළ බර කිලෝග්‍රෑම් 1000 ට අඩු වන්නා වූ ද, මෝටර් ට්‍රයිසිකලයක් හෝ මෝටර් ට්‍රයිසිකල් වැන් රථයක් සහ ආබාධ සහිත තැනැත්තන් විසින් භාවිත කරනු ලබන වාහනයක් ද ඇතුළත් විය යුතු ය. | | බී1 | ජී1 | ඊ, එෆ් |

| | | | | | |
|---|---|---|---|---|---|
| | (ii) කොඩ්‍රිසයිකල් | බී2 | | ජී1 | |
| 4. | (i) මෝටර් ලොරියක් | | සී | සී1, බී, බී1, බී2, ජී, ජී1, ජේ | බී |
| | (ii) සැහැල්ලු මෝටර් ලොරියක් | | සී1 | බී,බී1,බී2, ජී,ජී1, ජේ | බී |
| 5. | බර මෝටර් ලොරි | | සීඊ | සී,සී1,බී,බී1, බී2,ජී,ජී1, ජේ | බී |
| 6. | (i) මෝටර් කෝච් | | ඩී | ඩී1,සී,සී1 බී,බී1,බී2,ජී, ජී1,ජේ | ඒ |
| | (ii) සැහැල්ලු මෝටර් කෝච් | | ඩී1 | සී1,බී,බී1, බී2,ජී,ජී1 | ඒ1 |
| 7. | බර මෝටර් කෝච් | | ඩීඊ | ඩී, ඩී1, සීඊ, සී,සී1,බී, බී1, බී2,ජී,ජී1 ජේ | ඒ |
| 8. | ට්‍රේලරයක් සහිත හෝ රහිත ඉඩම් වාහනය | | ජී | ජී1 | |
| 9. | අත් ට්‍රැක්ටරය | | ජී1 | | |
| 10. | විශේෂ කාර්ය වාහනය | | ජේ | බී, ජී, ජී1 | බී, ජී |
| 11. | ආබාධ සහිත තැනැත්තන් විසින් භාවිත කරනු ලබන වාහනය | එච් | | | |

.”.

**6.** ප්‍රධාන ප්‍රඥප්තියේ 122අ වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:- ප්‍රධාන ප්‍රඥප්තියේ 122අ වන වගන්තිය සංශෝධනය කිරීම.

"රියදුරු බලපත්‍ර කාණ්ඩයන්.

122අ. (1) මෝටර් වාහන සඳහා නිකුත් කරන ලද අවසර පත්‍ර හෝ බලපත්‍ර කාණ්ඩයන් පහත පරිදි විය යුතු ය:-

(i) පුහුණුවන්නන්ගේ අවසර පත්‍රය;

(ii) සැහැල්ලු මෝටර් වාහන සඳහා වූ රියදුරු බලපත්‍රය; හෝ

(iii) බර මෝටර් වාහන සඳහා වූ රියදුරු බලපත්‍රය.

(2) මෙම කොටසේ අරමුණු සඳහා-

(අ) සැහැල්ලු මෝටර් වාහන, 122 වන වගන්තිය සඳහා වන උපලේඛනයේ 1(i), 1(ii), 2(i), 2(ii), 2(iii), 3(i), 3(ii), 8, 9 හෝ 11 යන අයිතමවල නිශ්චිතව සඳහන් වාහන පන්තිවලින් සමන්විත විය යුතු ය; සහ

(ආ) බර මෝටර් වාහන, 122 වන වගන්තිය සඳහා වන උපලේඛනයේ 4(i), 4(ii), 5, 6(i), 6(ii), 7 හෝ 10 යන අයිතමවල නිශ්චිතව සඳහන් වාහන පන්තිවලින් සමන්විත විය යුතු ය.".

**7.** ප්‍රධාන ප්‍රඥප්තියේ 124 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:- ප්‍රධාන ප්‍රඥප්තියේ 124 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) එම වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදයේ "ඉල්ලුම්කරු ශාරීරික වශයෙන් යෝග්‍ය බවට" යන වචන වෙනුවට "ඉල්ලුම්කරු ශාරීරික වශයෙන් හා මානසික වශයෙන් යෝග්‍ය බවට" යන වචන ආදේශ කිරීමෙන්;

(2) එම වගන්තියේ (2) වන සහ (3) වන උපවගන්ති ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්ති ආදේශ කිරීමෙන්:-

"(2) 122 වන වගන්තිය සඳහා වූ උපලේඛනයේ 1(i), 1(ii), 2(i), 2(ii), 2(iii), 3(i), 3(ii), 8, 9 සහ 11 යන අයිතමවල නිශ්චිතව සඳහන් පන්තිවලට අයත් මෝටර් වාහන සඳහා වූ වලංගු වන රියදුරු බලපත්‍රයක් සඳහා වූ සෑම ඉල්ලුම්කරුවකු ම-

(අ) තමා වයස අවුරුදු දහඅට සම්පූර්ණ කළ බව;

(ආ) ඉල්ලුම් කරන ලද වාහන පන්තිය සඳහා කොමසාරිස් ජනරාල්වරයාගෙන් පුහුණුවන්නන්ගේ අවසර පත්‍රයක් ලබාගත් දිනයේ සිට අවම වශයෙන් මාස තුනක කාලයක් එකී ඉල්ලුම් කරන ලද වාහන පන්ති සඳහා පුහුණුවන රියදුරකු ලෙස කටයුතු කර ඇති බව;

(ඇ) නියෝග මගින් නියම කරනු ලැබිය හැකි අධ්‍යාපන හෝ අනෙකුත් සුදුසුකම් සතු බව,

කොමසාරිස් ජනරාල්වරයා සෑහීමට පත්වන ආකාරයට ඔප්පු කළ යුතු ය.

(3) බර මෝටර් වාහන සඳහා වූ රියදුරු බලපත්‍රයක් සඳහා වූ සෑම ඉල්ලුම්කරුවකු ම-

(අ) තමා අවුරුදු විසි එක සම්පූර්ණ කළ බව;

(ආ) ඉල්ලුම් කරන ලද වාහන පන්තිය සඳහා කොමසාරිස් ජනරාල්වරයාගෙන් පුහුණුවන්නන්ගේ අවසරපත්‍රයක් ලබාගත් දිනයේ සිට අවම වශයෙන් මාස තුනක කාලයක් එකී ඉල්ලුම් කරන ලද වාහන පන්තිය සඳහා පුහුණුවන රියදුරකු ලෙස කටයුතු කර ඇති බව;

(ඇ) නියෝග මගින් නියම කරනු ලැබිය හැකි පරිදි මෝටර් වාහනයේ යාන්ත්‍රණ පිළිබඳ ප්‍රමාණවත් ප්‍රායෝගික දැනුමක් ඇති බව;

(ඈ) නියෝග මගින් නියම කරනු ලැබිය හැකි පරිදි අධ්‍යාපන සහ වෙනත් සුදුසුකම් සතු බව;

(ඉ) 122 වන වගන්තිය සඳහා වන උපලේඛනයේ 2(i), 2(ii), 2(iii), 3(i), 3(ii) හෝ 8 යන අයිතමවල නිශ්චිතව දක්වා ඇති පන්තිවලට අයත් මෝටර් වාහන සඳහා වලංගු වන රියදුරු බලපත්‍රයක් අවුරුදු දෙකකට නොඅඩු කාලයක් ඔහු විසින් දරනු ලබන බව,

කොමසාරිස් ජනරාල්වරයා සෑහීමට පත්වන ආකාරයට ඔප්පු කළ යුතු ය.”.

ප්‍රධාන ප්‍රඥප්තියේ 125 වන වගන්තිය සංශෝධනය කිරීම.

**8.** ප්‍රධාන ප්‍රඥප්තියේ 125 වන වගන්තියේ (5) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

“(5)(අ) (i) වයස අවුරුදු දහඅට එළඹ නොමැති කිසිම තැනැත්තකුට, 122 වන වගන්තිය සඳහා වූ උපලේඛනයේ 1(i), 1(ii), 2(i), 2(ii), 2(iii), 3(i), 3(ii), 8, 9 හෝ 11 යන අයිතමවල නිශ්චිතව දැක්වෙන පන්තිවලට අයත් මෝටර් වාහන සම්බන්ධයෙන්; සහ

(ii) වයස අවුරුදු විසිඑක එළඹ නොමැති කිසිම තැනැත්තකුට, 122 වන වගන්තිය සඳහා වූ උපලේඛනයේ 4(i), 4(ii), 5, 6(i), 6(ii), 7 හෝ 10 යන අයිතමවල නිශ්චිතව දැක්වෙන පන්තිවලට අයත් මෝටර් වාහන සම්බන්ධයෙන්,

රියදුරු බලපත්‍ර නිකුත් කරනු නොලැබිය යුතු ය.

(ආ) නිශ්චිතව සඳහන් කරන ලද වයස් සීමාවට වඩා අඩු වූ යම් තැනැත්තකු සඳහා නිකුත් කරන ලද රියදුරු බලපත්‍රයක් සඳහා නීතියේ බලාත්මකතාවයක් හෝ බලපෑමක් නොතිබිය යුතු ය.”.

ප්‍රධාන ප්‍රඥප්තියේ 126 වන වගන්තිය සංශෝධනය කිරීම.

**9.** ප්‍රධාන ප්‍රඥප්තියේ 126 වන වගන්තියේ (1) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) එම උපවගන්තියේ (අ) ඡේදයේ සඳහන් “122 වන වගන්තියේ උපලේඛනයේ 4(i), 4(ii), 5, 6(i), 6(ii), 7, 9 සහ 10 යන අයිතමවල”

යන වචන සහ ඉලක්කම් වෙනුවට "122 වන වගන්තිය සඳහා වන උපලේඛනයේ 4(i), 4(ii), 5, 6(i), 6(ii), 7 සහ 10 යන අයිතමවල" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්; සහ

(2) එම උපවගන්තියේ (ආ) ඡේදයේ සඳහන් "122 වන වගන්තිය සඳහා වන උපලේඛනයේ 1(i), 1(ii), 2, 3 සහ 8 යන අයිතමවල" යන වචන සහ ඉලක්කම් වෙනුවට "122 වන වගන්තිය සඳහා වන උපලේඛනයේ 1(i), 1(ii), 2(i), 2(ii), 2(iii), 3(i), 3(ii), 8, 9 හෝ 11 යන අයිතමවල" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 126ආ වන වගන්තිය සංශෝධනය කිරීම.

**10.** ප්‍රධාන ප්‍රඥප්තියේ 126ආ වන වගන්තිය ඉවත් කොට, පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:-

"රියදුරු බලපත්‍ර අලුත් කිරීම.

126ආ. (1) 126 වගන්තියේ (2) වන සහ (3) වන උපවගන්තිවල සහ 126අ වන වගන්තියේ විධිවිධානවලට යටත් ව,සෑම රියදුරු බලපත්‍රයක්, එය නිකුත් කරනු ලැබුවේ යම් කාලයකට ද එකී රියදුරු බලපත්‍රයේ කාලය අවසන් වීමේ දී, 122 වන වගන්තිය සඳහා වූ උපලේඛනයේ 1(i), 1(ii), 2(i), 2(ii), 2(iii), 3(i), 3(ii), 8, 9 හෝ 11 යන අයිතමයක සඳහන් පන්තිවලට අයත් මෝටර් වාහනයක් සම්බන්ධයෙන් වන විට, එක් වරකට අවුරුදු අටක තවදුරටත් වූ කාලයක් සඳහා සහ, එකී උපලේඛනයේ 4(i), 4(ii), 5, 6(i), 6(ii), 7 හෝ 10 යන අයිතමයක සඳහන් පන්තියක මෝටර් වාහනයක් සම්බන්ධයෙන් වන විට, එක් වරකට අවුරුදු හතරක තවදුරටත් වූ කාලයක් සඳහා ද එම රියදුරු බලපත්‍රය අලුත් කරනු ලැබිය යුතු ය.

(2) රියදුරු බලපත්‍රයක් අලුත් කිරීම සඳහා වන සෑම ඉල්ලීමක් ම—

(අ) නියමිත ආකෘති පත්‍රයෙන් විය යුතු ය;

(ආ) නියමිත අයභාරය ගෙවිය යුතු ය;

(ඇ) 124 වන වගන්තියේ (1)(අ) උපවගන්තිය ප්‍රකාරව නිකුත් කරන ලද වෛද්‍ය සහතිකයක් ඇතුළත් විය යුතු ය.

(3) රියදුරු බලපත්‍රයක් අලුත් කිරීම සඳහා වූ සෑම ඉල්ලීමක් ම, එකී රියදුරු බලපත්‍රයේ කාලය අවසන් වීමට මාස තුනකට පෙර කොමසාරිස් ජනරාල්වරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 128අ වන වගන්තිය සංශෝධනය කිරීම.

**11.** ප්‍රධාන ප්‍රඥප්තියේ 128අ වන වගන්තියේ (3) වන උපවගන්තිය ඉවත්කොට, ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

"(3) අමාත්‍යවරයා විසින්, අවස්ථාවෝචිත පරිදි, රියදුරු බලපත්‍රයක් දරන්නකුට හදිසි අවස්ථා වාහනයක් හෝ පොදු සේවා වාහනයක් පැදවීම සඳහා බලය පැවරීමට රියදුරු බලපත්‍රයක් මත පිටසනක් කිරීම සඳහා සුදුසුකම් ලැබීමට අදාළ වන අවශ්‍යතා, සුදුසුකම් සහ පැවැත්විය යුතු පරීක්ෂණ නියෝග මගින් නියම කළ හැකි ය.".

ප්‍රධාන ප්‍රඥප්තියට 128ඇ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

**12.** ප්‍රධාන ප්‍රඥප්තියේ 128ආ වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එම වගන්ති මෙම ප්‍රඥප්තියේ 128ඇ වන වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය:-

"රසායනික ද්‍රව්‍ය හෝ උපද්‍රවකාරී අපද්‍රව්‍ය ආදිය පැටවූ මෝටර් වාහන පැදවීම.

128ඇ. (1) රසායන ද්‍රව්‍ය, උපද්‍රවකාරී අපද්‍රව්‍ය, ඛණිජ තෙල් නිෂ්පාදන, ගෑස් හෝ වෙනත් අන්තරායදායක භාණ්ඩ රැගත් මෝටර් වාහනයක් පැදවීමට අදහස් කරන යම් තැනැත්තකු, 122 වන වගන්තිය සඳහා වන උපලේඛනයේ 2(ii), 4(i), 4(ii) හෝ 5 වන අයිතමයෙ හි දැක්වෙන පන්ති සඳහා වන රියදුරු බලපත්‍රයක් සඳහා නියමිත ගාස්තුව සමඟ නියමිත ආකෘති පත්‍රයකින් කොමසාරිස් ජනරාල්වරයා වෙත ඉල්ලීමක් ඉදිරිපත් කළ යුතු ය.

(2) යම් තැනැත්තකු (1) වන උපවගන්තියේ සඳහන් මෝටර් රථයක් පැදවීම සඳහා යෝග්‍ය ද යන්න තීරණය කිරීමේ කාර්යය සඳහා සපුරාලිය යුතු සුදුසුකම් සහ පැවැත්විය යුතු පරීක්ෂණය අමාත්‍යවරයා විසින් නියෝග මගින් නියම කරනු ලැබිය හැකි ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 133අ වගන්තිය සංශෝධනය කිරීම.

**13.** ප්‍රධාන ප්‍රඥප්තියේ 133අ වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) එම වගන්තියේ (1) සහ (1අ) වන උපවගන්ති ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්ති ආදේශ කිරීමෙන්:-

"(1) අමාත්‍යවරයා විසින් -

(අ) අවාසි සහගත ලකුණු නියම කළ යුතු වැරදි; සහ

(ආ) එම වැරදි සඳහා අදාළ වන අවාසි සහගත ලකුණු,

නියෝග මගින් නියම කළ හැකි ය.

(1අ) (අ) (i) රියදුරු බලපත්‍රයක් දරන්නකු (1) වන උපවගන්තිය යටතේ නියම කරනු ලබන වරදකට වරදකරු කරනු ලැබූ අවස්ථාවක දී, සහ එම වරද රියදුරු බලපත්‍රය අත්හිටුවීමට හෝ අවලංගු කිරීමට තරම් බරපතල වරදක් නොවන විට දී, අවාසි සහගත ලකුණු ඇතුළත් කිරීමට පිහිටුවන ලද දත්ත පද්ධතියට අදාළ වරද සඳහා වන අවාසි සහගත ලකුණු ඇතුළත් කරන ලෙස අධිකරණය විසින් පොලිස්පතිවරයාට නියම කළ හැකි ය.

(ii) රියදුරු බලපත්‍රයක් දරන්නකු 215අ වන වගන්තිය යටතේ ස්ථානීය දඩ නියම කර ඇති වරදක් පිළිගනු ලැබූ අවස්ථාවක දී පොලිස්පතිවරයා විසින්, අවාසි සහගත ලකුණු ඇතුළත් කිරීමට පිහිටවනු ලැබූ දත්ත පද්ධතියට අදාළ වරද සඳහා වන අවාසි සහගත ලකුණු ඇතුළත් කළ යුතු ය.

(ආ) මෙම වගන්තියේ අරමුණ සඳහා එක් එක් පළාත භාර නියෝජ්‍ය පොලිස්පතිවරයා විසින් දත්ත පද්ධතිය සඳහා අදාළ අවාසි සහගත ලකුණු ඇතුළත් කිරීම සඳහා පොලිස් සැරයන්වරයකුට හෝ ඊට ඉහළ නිලධරයකුට බලය ලබා දිය යුතු ය. නියෝජ්‍ය පොලිස්පතිවරයා විසින් එම අදාළ අවාසි සහගත ලකුණ අවශ්‍ය පරිදි නියමිත ආකාරයෙන් රියදුරු බලපත්‍රය සඳහා හෝ පිටසන් පත්‍රයේ ඇතුළත් කිරීම සඳහා කොමසාරිස් ජනරාල්වරයා වෙත යැවිය යුතු ය.

(ඇ) මෙම වගන්තියේ 'පළාත' යනුවෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154අ වන ව්‍යවස්ථාව අනුව පිහිටුවන ලද පළාත් සභා අදහස් වේ.".

(2) එම වගන්තියේ (3) වන උපවගන්තිය ඉවත් කිරීමෙන් ;

(3) එම වගන්තියේ (5) වන උපවගන්තිය ඉවත් කිරීමෙන් ;

**14.** ප්‍රධාන ප්‍රඥප්තියේ 133අ වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය එහි 133ආ වන වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය:-

ප්‍රධාන ප්‍රඥප්තියට 133ආ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

"මෙම පනත යටතේ වන වැරදි සඳහා දඬුවම් නියම කිරීමේ දී අවාසි සහගත ලකුණු ඇතුළත් කිරීම.

133ආ. මෙම පනතේ සඳහන් යම් තැනැත්තකු—

(1) යම් වගන්තියක විධිවිධාන උල්ලංඝනය කරන්නේ නම්; හෝ

(2) 224 වන වගන්තිය යටතේ නිශ්චිතව දක්වා ඇති දඬුවමට අදාළ වරදක් සඳහා වරදකරු වන්නේ නම්; හෝ

(3) පනත යටතේ වන යම් නියෝගයක් උල්ලංඝනය කරන්නේ නම්,

මහෙස්ත්‍රාත්වරයා විසින් එකී තැනැත්තා වරදකරු කිරීමේ දී පහත දැක්වෙන දඬුවම් නියම කරනු ලැබිය හැකි ය:-

(අ) එකී වරදක් සඳහා අදාළ වගන්තියේ නිශ්චිතව දක්වා ඇති දඩයක්; හෝ

(ආ) එකී වරදක් සඳහා අදාළ වගන්තියේ නිශ්චිතව දක්වා ඇති පරිදි බන්ධනාගාරගත කිරීමේ කාලසීමාව; හෝ

(ඇ) 133අ වන වගන්තිය යටතේ අදාළ අවාසි සහගත ලකුණු ඇතුළත් කිරීමට පොලිස්පතිවරයාට නියෝගයක් නිකුත් කිරීම; හෝ

(ඈ) යථෝක්ත දණ්ඩනයන් එක්කර සාදන ලද ඕනෑම දණ්ඩනයක්; හෝ

(ඉ) යථෝක්ත (අ), (ආ) සහ (ඇ) යන ඡේදයන් යටතේ වන සියලු දඬුවම්.''.

**15.** ප්‍රධාන ප්‍රඥප්තියේ 139ආආ වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

ප්‍රධාන ප්‍රඥප්තියේ 139ආආ වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) එම වගන්තියේ (3) වන උපවගන්තියේ සඳහන් "122 වගන්තියේ උපලේඛනයේ 1(i), 1(ii), 2, 3 සහ 8 යන

අයිතමවල" යන වචන වෙනුවට "122 වන වගන්තිය සඳහා වන උපලේඛනයේ 1(i), 1(ii), 2(i), 2(ii), 2(iii), 3(i), 3(ii), 8 සහ 9 යන අයිතමයන්" යන වචන ආදේශ කිරීමෙන්;

(2) එම වගන්තියේ (4) වන උපවගන්තියේ සඳහන් "122 වන වගන්තියේ උපලේඛනයේ 1(i), 1(ii), 2, 3, 4(i), 4(ii), 6(i), 6(ii), 8 සහ 10 යන අයිතමවල" යන වචන වෙනුවට "122 වන වගන්තිය සඳහා වන උපලේඛනයේ 1(i), 1(ii), 2(i), 2(ii), 2(iii), 3(i), 3(ii), 4(i), 4(ii), 6(i), 6(ii), 8 සහ 10 යන අයිතමවල" යන වචන ආදේශ කිරීමෙන්;

(3) එම වගන්තියේ (5) වන උපවගන්තියේ සඳහන් "122 වන වගන්තියේ උපලේඛනයේ 1(i), 1(ii), 2, 3, 4(i), 4(ii), 5, 6(i), 6(ii), 7, 8, 9 සහ 10 යන අයිතමවල" යන වචන වෙනුවට "122 වන වගන්තිය සඳහා වන උපලේඛනයේ 1(i), 1(ii), 2(i), 2(ii), 2(iii), 3(i), 3(ii), 4(i), 4(ii), 5, 6(i), 6(ii), 7, 8, 9 සහ 10 යන අයිතමවල" යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 140 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

**16.** ප්‍රධාන ප්‍රඥප්තියේ 140 වන වගන්තිය ඉවත් කර පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:-

"වේග සීමාවන්.

140. (1) මොටර් වාහනයක්, නියෝග මගින් නියම කරනු ලබන වේග සීමාවන් ඉක්මවන්නා වූ අධික වේගයකින් ධාවනය කිරීම නොකළ යුතු ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධාන, හදිසි අවස්ථා කටයුතුවල යෙදී සිටින යම් ගිලන් රථයක්, ගිනි නිවන වාහනයක් හෝ පොලිස් වාහනයක් සඳහා අදාළ නොවිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 157අ වන වගන්තිය සංශෝධනය කිරීම.

**17.** ප්‍රධාන ප්‍රඥප්තියේ 157අ වන වගන්තියේ (4) වන උපවගන්තියේ සඳහන් "(1) වන හෝ (3) වන උපවගන්තියේ විධිවිධාන" යන වචන වෙනුවට "(3) වන උපවගන්තියේ විධිවිධාන" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 161 වන වගන්තිය සංශෝධනය කිරීම.

**18.** ප්‍රධාන ප්‍රඥප්තියේ 161 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) එහි (1) වන උපවගන්තියේ -

(අ) (අ) ඡේදයේ (iii), (iv) සහ (v) යන උපඡේද ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන උපඡේද ආදේශ කරනු ලැබේ:-

"(iii) යම් තැනැත්තකුට තුවාල සිදුව ඇති විට දී එම පුද්ගලයාගේ ඉල්ලීම මත හෝ, එම තැනැත්තා සිහිසුන්ව සිටිනවා නම් හෝ එම තැනැත්තාට සිදුවූ තුවාල හේතුවෙන් ඔහුගේ ජීවිතය අනතුරුදායක තත්වයක් ඇති බව පෙනී යනවා නම් වහාම එම තැනැත්තා රෝහලකට හෝ වෛද්‍ය වෘත්තිකයකු වෙත රැගෙන යා යුතු අතර, ඉන්පසු එම අනතුර පිළිබඳව ළඟම පිහිටි පොලිස් ස්ථානයේ ස්ථානාධිපතිවරයාට වාර්තා කළ යුතු ය;

(iv) (iii) වන උපඡේදයේ සඳහන් නොවන ඕනෑම අවස්ථාවක දී වහාම ළඟම පිහිටි පොලිස් ස්ථානයේ ස්ථානාධිපතිවරයාට (4) වන උපවගන්තිය යටතේ නියම කරනු ලබන ආකෘතියට අනුව අනතුර පිළිබඳව වාර්තා කරනු ලැබිය යුතු ය; සහ

(v) (4) වන උපවගන්තියේ නියම කරනු ලබන ආකෘතියට අනුව අනතුර පිළිබඳව වහාම ළඟම පිහිටි පොලිස් ස්ථානයේ ස්ථානාධිපතිවරයාට වාර්තා කිරීමට අපොහොසත් වන යම් රියදුරකු වරදකට වරදකරුවකු වන අතර, වරදකරු කිරීමේ දී රුපියල් තුන්දහසකට නොඅඩු සහ රුපියල් පන්දහසකට නොවැඩි දඩයකට යටත් විය යුතු ය.";

(ආ) (ඈ) ඡේදයේ (ii) වන උපඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කරනු ලැබේ:-

"(ii) අනතුර සිදුවී පැය විසිහතරක් ඇතුළත, (4) වන උපවගන්තියේ නියම කරනු ලබන ආකෘතියට අනුව ඔහුගේ නම, ලිපිනය සහ අනතුර සිදුවන අවස්ථාවේ දී ඔහු එම වාහනයේ සිටි බව ළඟම පිහිටි පොලිස් ස්ථානයේ ස්ථානාධිපතිවරයාට දැනුම් දිය යුතු ය.";

(ඇ) (ඈ) ඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කරනු ලැබේ:-

"(ඈ) එවැනි අනතුරක් සම්බන්ධයෙන් රක්ෂණ හිමිකම්පෑමක් වෙනුවෙන් ඉල්ලීමක් යම් රක්ෂණ සමාගමක් වෙත ඉදිරිපත් කරන්නේ නම් එම රක්ෂණ සමාගම විසින්-

(i) අනතුරට අදාළව සංඛ්‍යා ලේඛන වාර්තා සකස් කිරීමේ කාර්යය සඳහා එකී හිමිකම්පාන තැනැත්තා විසින් තමාට දැනුම් දුන් පරිදි එම අනතුරට අදාළ තොරතුරු සහ එකී අනතුරට සම්බන්ධ පාර්ශ්වයන්ගේ නම් සහ ලිපින සමග එකී අනතුර පිළිබඳව ළඟම ඇති පොලිස් ස්ථානයේ පොලිස් ස්ථානාධිපතිවරයා වෙත දැනුම් දිය යුතු ය;

(ii) (4) වන උපවගන්තියේ සඳහන් ආකෘතියේ පිටපතක් ළඟම පිහිටි පොලිස් ස්ථානයේ පොලිස් නිලධරයා විසින් සහතික කරන තුරු කිසිදු හිමිකම්පෑමක් ලබා නොදිය යුතු ය;";

(2) (3) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන උපවගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය (4) වන උපවගන්තිය වශයෙන් බලාත්මක විය යුතු ය:-

"(4) අමාත්‍යවරයා විසින්-

(අ) ළඟම පිහිටි පොලිස් ස්ථානයට අනතුරක් පිළිබඳව වාර්තා කිරීමේ දී අනුගමනය කළ යුතු ක්‍රියා පටිපාටිය නිශ්චිතව දක්වමින්;

(ආ) අනතුර වාර්තා කිරීමට අදාළ ආකෘතිය නිශ්චිතව දක්වමින්; සහ

(ඇ) මෙම වගන්තිය හා සම්බන්ධ අවස්ථාවෝචිත පරිදි වෙනත් තොරතුරු නිශ්චිතව දක්වමින්,

නියෝග නියම කරනු ලැබිය හැකි ය.".

**19.** ප්‍රධාන ප්‍රඥප්තියේ 215අ වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:- ප්‍රධාන ප්‍රඥප්තියේ 215අ වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

"ස්ථානීය දඩය.

215අ. (1) යම් තැනැත්තකු මෙම පනත සඳහා වන දෙවන උපලේඛනයේ ඇතුළත් යම් වගන්තියක විධිවිධානයක් උල්ලංඝනය කරන්නේ නම් හෝ, එවැනි යම් වගන්තියක් යටතේ නීත්‍යනුකූලව නිකුත් කරන ලද යම් නියමයකට, විධානයකට, ඉල්ලීමකට, අවශ්‍යතාවයකට හෝ දැන්වීමකට අනුව ක්‍රියා කිරීමට අපොහොසත් වන්නේ නම්, එකී තැනැත්තා වරදකට වරදකරු විය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ පොලිස් නිලධරයකු විසින් වරදක් සොයා ගනු ලැබූ විට සහ එම වරද සඳහා වගකීම එම තැනැත්තා පිළිගනු ලැබූ විට, එකී තැනැත්තා එකී වරදට නඩු පැවරීමට ලක්වීම වෙනුවට එම වරද සඳහා නියෝග මගින් නියම කළයුතු ස්ථානීය දඩය ගෙවීමට එකඟ විය හැකි ය.

(3) වගකීම පිළිගත් වරද, අවාසි සහගත ලකුණුවලට යටත් වූ වරදක් වූ විට, 133අ වගන්තිය යටතේ අවාසි සහගත ලකුණු එකී වරද සඳහා ඇතුළත් කරනු ලැබිය යුතු ය.

(4) එකී දඩය ගෙවීම-

(i) ඕනෑම තැපැල් කාර්යාලයකට; හෝ

(ii) නියම කර ඇති ඕනෑම රාජ්‍ය ආයතනයකට; හෝ

(iii) නියම කර ඇති ඉලෙක්ට්‍රොනික මාධ්‍යයකින්,

සිදු කළ හැකි ය.

(5) දඩය ගෙවූ බවට ඔප්පු කිරීමේ සාක්ෂි, වරද සොයා ගැනීම සිදුකළ පොලිස් නිලධාරියා විසින් නම් කරන ලද පොලිස් ස්ථානයේ ස්ථානාධිපතිවරයා වෙත පෞද්ගලිකව ම භාරදීමෙන් හෝ ලියාපදිංචි තැපෑලෙන් හෝ නියම කර ඇති ඉලෙක්ට්‍රොනික මාධ්‍යයකින්, වරද සොයා ගැනීම සිදුකළ දිනයේ සිට සති දෙකක් ඇතුළත ඉදිරිපත් කළ යුතු ය.

(6) යම් තැනැත්තකු (5) වන උපවගන්තිය යටතේ නිශ්චිතව දක්වා ඇති කාල පරිච්ඡේදය තුළ දී එකී දඩය ගෙවීමට අපොහොසත් වන විට මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩුවක් ගොනු කිරීමට පෙර, (5) වන උපවගන්තිය යටතේ දක්වා ඇති කාලය අවසන් වූ වහාම සති දෙකක් ඇතුළත දී එකී වරද සඳහා නියමිත දඩ ප්‍රමාණය මෙන් දෙගුණයක් ගෙවීමට අවසර දෙනු ලැබිය හැකි ය.".

**20.** ප්‍රධාන ප්‍රඥප්තියේ 224 වන වගන්තියේ "වරදකරු කරනු ලැබීමේ දී" යන වචනවලින් ආරම්භ වන ස්ථානයේ සිට එම වගන්තියේ අවසානය දක්වා ඇති සියලු වචන වෙනුවට, "වරදකරු කරනු ලැබීමේ දී රුපියල් දෙදහස් පන්සියයකට නොඅඩු සහ රුපියල් තුන්දහස් පන්සියයක් නොඉක්මවන දඩයකට ද දෙවන වරට වරදකට වරදකරු කරනු ලැබීමේ දී රුපියල් තුන්දහස් පන්සියයකට නොඅඩු සහ රුපියල් දසදහසක් නොඉක්මවන දඩයකට ද, තුන්වන හෝ තදනන්තර වරදකරු කරනු ලැබීමේ දී රුපියල් දසදහසකට නොඅඩු සහ රුපියල් විසිපන්දහසක් නොඉක්මවන දඩයකට ද යටත් විය යුතු ය." යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 224 වන වගන්තිය සංශෝධනය කිරීම.

**21.** ප්‍රධාන ප්‍රඥප්තියේ 240 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

ප්‍රධාන ප්‍රඥප්තියේ 240 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) "මියයාම" යන යෙදුමේ අර්ථ නිරූපණය ඉවත් කර පහත දැක්වෙන අර්ථ නිරූපණ ඇතුළත් කිරීමෙන්:-

" "මියයාම" යන්නෙන්, යම් වාහන අනතුරක ප්‍රතිඵලය වශයෙන් යම් තැනැත්තකු ක්ෂණිකව මරණයට පත් වීම හෝ එම අනතුරේ ප්‍රතිඵලයක් වශයෙන් පසු ව මියයාම අදහස් වේ;

"අවාසි සහගත ලකුණු" යන්නෙන් වෙනත් දඬුවම් වලට අමතරව වරදකරුගේ රියදුරු බලපත්‍රයට හෝ පිටසන් පත්‍රයට ඇතුළත් කරනු ලබන මෝටර් වාහන පනත යටතේ ඇති රථවාහන වැරදි සඳහා වෙන්කර ඇති ලකුණු අදහස් වේ;";

(2) "ද්විත්ව කාර්ය වාහන" යන යෙදුමේ අර්ථ නිරූපණයට ඉක්බිතිව ම පහත දැක්වෙන අර්ථ නිරූපණය ඇතුළත් කිරීමෙන්:-

'' "ඉලෙක්ට්‍රොනික" යන්නෙන් 2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනතේ ඊට දී ඇති අර්ථය ම තිබිය යුතු ය;";

(3) "හදිස්සි අවස්ථා වාහන" යන යෙදුමේ අර්ථ නිරූපණයේ (අ) ඡේදය ඉවත් කර පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:-

"(අ) හදිසි අවස්ථාවක දී භාවිත කරනු ලබන—

(i) රතු එළියක් භාවිත කිරීමෙන් හඳුනාගනු ලබන ගිනි නිවීම් සේවා දෙපාර්තමේන්තුව විසින් භාවිත කරනු ලබන ගිනි නිවන වාහනයක්;

(ii) රතු සහ නිල් එළියක් භාවිත කිරීමෙන් හඳුනාගනු ලබන පොලීසිය විසින් භාවිත කරනු ලබන වාහනයක්; සහ

(iii) රතු එළියක් භාවිත කිරීමෙන් හඳුනාගනු ලබන ගිලන්රථයක්; සහ";

(4) "ආබාධිතයන් සඳහා වූ රථය" යන යෙදුමේ අර්ථ නිරූපණය ඉවත් කිරීමෙන්;

(5) "මෝටර් සයිකලය" යන යෙදුමේ අර්ථ නිරූපණයට ඉක්බිතිව ම පහත දැක්වෙන අර්ථ නිරූපණය යෙදීමෙන්:-

'' "මෝටර් නිවස" යන්නෙන්, ගෙන යා හැකි මගීන් සංඛ්‍යාව (රියදුරුද ඇතුළත්ව) හය දෙනකු නොඉක්මවන්නා වූ, මගීන් ප්‍රවාහනය සඳහා සහ නවාතැන් පහසුකම් ලබාදීම සඳහා සැලසුම් කළ සහ නිර්මාණය කරන ලද ට්‍රේලරයක් රහිත, වාහනයේ දළ බර කිලෝග්‍රෑම් හාරදහස් පන්සියයක් නොඉක්මවන වාහනයකි;'';

(6) "ප්‍රසිද්ධ නැවතුම් පොළ" යන යෙදුමේ අර්ථ නිරූපණයට ඉක්බිතිව ම පහත දැක්වෙන අර්ථ නිරූපණය ඇතුළත් කිරීමෙන්:-

" "කොඩ්‍රිසයිකල්" යන්නෙන් තාර බර කිලෝග්‍රෑම් පන්සියයට අඩු වන සහ එන්ජින් ධාරිතාව සීසී එකසිය අනූනවය සහ සීසී හාරසිය අනූනවය අතර වන හෝ ඉලෙක්ට්‍රොනික මෝටර් රථයක් හෝ දකුණතින් පදවන සම්බන්ධිත ආවරණය වූ බඳ කොටසක් සහිත ඉලෙක්ට්‍රොනික වාහනයක් සම්බන්ධයෙන් වන විට දී කිලෝවොට් පහළව නොඉක්මවන උපරිම අඛණ්ඩ අනුපාත බලයක් සහිත වාහන සහ රියදුරුද ඇතුළත්ව පුද්ගලයන් පස් දෙනකුට නොවැඩි ආසන ධාරිතාවක් සහිත පුද්ගලයන් ගෙනයාම සඳහා යොදා ගන්නා මෙම පන්තියට අයත් වාහන හෝ උපරිම වාහනයේ දළ බර කිලෝග්‍රෑම් දහසක් වන භාණ්ඩ ගෙනයන වාහන අදහස් වේ;";

(7) "විශේෂ කාර්ය වාහනය" යන යෙදුමේ අර්ථ නිරූපණය වෙනුවට පහත දැක්වෙන අර්ථ නිරූපණය ආදේශ කිරීමෙන්:-

" "විශේෂ කාර්ය වාහනය" යන්නෙන් විශේෂ වැසි සහිත වාහන හෝ මහජන උපයෝගීතා වාහන (කසළ ට්‍රක් රථ, වීදි පිරිසිදු කිරීමේ යන්ත්‍ර ආදිය), ඉදිකිරීම් වාහන (ජංගම ක්‍රේන් රථ, සිදුරු කැණීමේ යන්ත්‍ර, ජංගම යන්ත්‍රාගාර, අධි ශිතකරණ සහිත ට්‍රක්රථ, ඔසවන උපකරණ, පැටවීම් යන්ත්‍ර ආදිය) සහ කෘෂිකාර්මික කටයුතු සඳහා සහ නඩත්තු කටයුතු සඳහා භාවිත වන වෙනත් යම් විශේෂ වාහන ආදිය ඇතුළත් විශේෂ කාර්යයන් සඳහා නිර්මාණය කරන ලද ප්‍රධාන විකරණයන් අන්තර්ගත කළ සාමාන්‍ය කාර්යයන් සඳහා වූ වැසියක් සහිත වන වාහන අදහස් වේ;";

(8) "වාහනය" යන යෙදුමේ අර්ථ නිරූපණයේ "දුම්රියක් ඊට ඇතුළත් නොවේ." යන වචන වෙනුවට "දුම්රියක් ඊට ඇතුළත් නොවේ;" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ;

(9) "වාහනය" යන යෙදුමේ අර්ථ නිරූපණයට ඉක්බිතිව ම පහත දැක්වෙන අර්ථ නිරූපණය ඇතුළත් කිරීමෙන්:-

" "ආබාධ සහිත තැනැත්තන් විසින් භාවිත කරන වාහන" යන්නෙන්, යම් ශාරීරික අශක්නුතාවයකින් හෝ ආබාධයකින් පෙළෙන තැනැත්තන්ගේ භාවිතය සඳහා හෝ එවන් තැනැත්තන් සඳහා පමණක් භාවිත කිරීම සඳහා විශේෂයෙන්ම සැලසුම් කළ සහ නිර්මාණය කළ හෝ අනුවර්තනය කළ මෝටර් වාහනයක් අදහස් වේ.".

ප්‍රධාන ප්‍රඥප්තියේ දෙවන උපලේඛනය සංශෝධනය කිරීම

**22.** අවසන් වරට 2005 අංක 12 දරන දඩ මුදල් වැඩි කිරීමේ පනතේ 2 වන වගන්තියෙන් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ දෙවන උපලේඛනය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) එහි III වන තීරුව ඉවත් කිරීමෙන්;

(2) එහි I වන සහ II වන තීරු ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:-

"දෙවන උපලේඛනය

[215අ වගන්තිය]

| | වගන්තිය | විධිවිධානය |
|---|---|---|
| 1 | 21, 22, 23, 24, 24(අ) වන වගන්ති | හඳුනාගැනීමේ තහඩු. |
| 2 | 38 වන වගන්තිය | මෝටර් වාහන මත ආදායම් බලපත්‍රය ප්‍රදර්ශනය කළ යුතු අතර, නියම කරනු ලැබූ විට ඉදිරිපත් කළ යුතු බව. |
| 3 | 45 වන වගන්තිය | ආදායම් බලපත්‍රය උල්ලංඝනය කරමින් මෝටර් වාහනයක් භාවිත කිරීම තහනම් බව. |

| | | |
|---|---|---|
| 4 | 99 වන වගන්තිය | වලංගු රක්ෂණාවරණයක් නොමැතිව ධාවනය කිරීම හෝ භාවිත කිරීම. |
| 5 | 123 වන වගන්තිය | රියදුරු බලපත්‍රයක් නොමැතිව ධාවනය කිරීම තහනම් කිරීම. |
| | | මෝටර් වාහනයක් ධාවනය කිරීම සඳහා තැනැත්තකු රියදුරු බලපත්‍රයක් නොමැතිව සේවයේ නියුක්ත කිරීම තහනම් කිරීම. |
| 6 | 123 වන වගන්තිය | නියමිත වයස් සීමාවන්ට පහළ තැනැත්තන්ට රිය ධාවනය තහනම් කිරීම. |
| 7 | 128අ වන වගන්තිය | නිසි බලය නොමැතිව හදිසි සේවා වාහනයක් සහ පොදු සේවා වාහනයක් පැදවීම. |
| 8 | 128ආ වන වගන්තිය | විශේෂ කාර්ය වාහන පැදවීම සඳහා නිසි රියදුරු බලපත්‍රයක් නොමැති වීම. |
| 9 | 128ඇ වන වගන්තිය | නිසි රියදුරු බලපත්‍රයක් නොමැතිව රසායනික ද්‍රව්‍ය හෝ අන්තරාදායක ද්‍රව්‍ය පැටවූ වාහන පැදවීම. |
| 10 | 130 වන වගන්තිය | නිශ්චිත වූ පන්තියකට අයත් වාහනයක් සඳහා බලපත්‍රයක් නොමැතිව පැදවීම. |
| 11 | 135 වන වගන්තිය | ධාවනය කරවන විට රියදුරු බලපත්‍රය රැගෙන යාමට අසමත් වීම. |
| 12 | 139අ වන වගන්තිය | උපදේශක බලපත්‍රයක් නොමැතිව උපදේශක කටයුතුවල නිරතවීම. |
| 13 | 140, 141 සහ 144අ වන වගන්ති | වේග සීමා විධිවිධානවලට අනනුකූලව ධාවනය කිරීම. |
| 14 | 148 වන වගන්තිය | මාර්ග රීතිවලට අවනත නොවීම. |

| | | |
|---|---|---|
| 15 | 152 වන වගන්තිය | ධාවනය කිරීමේ දී මෝටර් රථය පාලනය කරගැනීමට බාධා පැවතීම. |
| 16 | 153 වන වගන්තිය | රිය පැදවීමේ දී සහ අනෙකුත් අවස්ථාවන්හි දී නුසුදුසු සංඥා භාවිත කිරීම. |
| 17 | 154 වන වගන්තිය | මෝටර් වාහනයක් මාර්ගයේ දිගු දුරක් පසුපසට ධාවනය කිරීම. |
| 18 | 155 වන වගන්තිය | අනතුරු ඇඟවීමේ උපකරණ නිසි ලෙස භාවිත නොකිරීම. |
| 19 | 155අ වන වගන්තිය | විමෝචනය. |
| 20 | 156 වන වගන්තිය | මෝටර් වාහන පා පුවරුව යනාදියේ ගමන් කිරීම හෝ ගමන් කිරීම සඳහා ඉඩ දීම. |
| 21 | 157 වන වගන්තිය | මෝටර් වාහනවල ඉදිරිපස අසුන්වල සිටින තැනැත්තන් සංඛ්‍යාවේ සීමාවන්. |
| 22 | 157අ වන වගන්තිය | ආසන පටි භාවිත නොකිරීම. |
| 23 | 158 වන වගන්තිය | ධාවනය කරන විට ආරක්ෂිත හිස්වැසුම් පැළඳ නොතිබීම. |
| 24 | 159 වන වගන්තිය | ධාවනය වෙමින් පවතින මෝටර් වාහනයකින් දැන්වීම් බෙදාහැරීම නොකිරීම. |
| 25 | 160 වන වගන්තිය | වාහනයකින් අධික ශබ්දය නිකුත් කිරීම. |
| 26 | 162 වන වගන්තිය | පොලිස් නිලධාරීන් ආදීන්ගේ විධාන සහ සංඥාවලට අවනත නොවීම. |
| 27 | 164 වන වගන්තිය | මාර්ග සංඥාවලට අවනත නොවීම. |
| 28 | 165 වන වගන්තිය | ටැංකියට ඉන්ධන මුදා හැරීමේ දී ගත යුතු පූර්ව ආරක්ෂණ ක්‍රියාමාර්ග. |

| | | |
|---|---|---|
| 29 | 166 වන වගන්තිය | මාර්ගයක මෝටර් වාහන නැවැත්වීම හෝ ගාල් කර තැබීම නොකිරීම. |
| 30 | 167 වන වගන්තිය | මාර්ගයක මෝටර් වාහනයක් නවතා තැබීමේ දී හෝ එය ළඟ නොසිටීමේ දී හෝ අක්‍රිය වීමක දී ගතයුතු පූර්ව ආරක්ෂණ ක්‍රියාමාර්ග. |
| 31 | 178 වන වගන්තිය | මෝටර් වාහනවල සහ පෞද්ගලික කෝච් රථවල පෞද්ගලික ගමන් බඩු හැර, ගෙන යා හැකි අවසරලත් තැනැත්තන් හෝ මගීන් ප්‍රමාණය ඉක්මවා ගෙනයාම සහ පෞද්ගලික ගමන්බඩු හැර මෝටර් වාහනවල හෝ අවසරලත් පෞද්ගලික කෝච් රථවල ගෙන යා හැකි අවසරලත් බඩු ප්‍රමාණය ඉක්මවා ගෙන යාම. |
| 32 | 179 වන වගන්තිය | බස් රථවල පෞද්ගලික ගමන් මළු හැර අනුමත ප්‍රමාණය ඉක්මවා තැනැත්තන් හෝ මගීන් ගෙනයාම සහ භාණ්ඩ ගෙනයාම. |
| 33 | 188 වන වගන්තිය | උපරිම බර හෝ ඇක්සල් බර ඉක්මවා ලොරි රථවල හෝ මෝටර් ට්‍රයිසිකල් වැන් රථවල භාණ්ඩ ගෙනයාම. |
| 34 | 189 වන වගන්තිය | ලොරි රථයක ගෙනයා හැකි තැනැත්තන් ප්‍රමාණය ඉක්ම වීම. |
| 35 | 190 වන වගන්තිය | නියමයන් උල්ලංඝනය කිරීම. |
| 36 | 196 වන වගන්තිය | විමෝචන සහතිකය සහ යෝග්‍යතා සහතිකය වාහනයේ නොතිබීම. .”. |

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**23.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 875 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළෙඹන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකි ය.